කොන්ක්‍රීට් කණුමත දිවෙන (Elevated) වරාය ප්‍රවේශ මාර්ග ව්‍යාපෘතිය - 2018

---

කොන්ක්‍රීට් කණුමත දිවෙන (Elevated) වරාය ප්‍රවේශ මාර්ග ව්‍යාපෘතියේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර 2019 ජනවාරි 17 දින එළඹි අංක 3716 - එස්ආර්අයි දරන ණය ගිවිසුම සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, එවකට මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යාංශය, වර්ථමානයේ මහාමාර්ගයේ මහාමාර්ග හා මාර්ග සංවර්ධන හා ඛණිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය ක්‍රියාත්මක කරවීමේ ආයතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ.කොළඹ නගරයේ රථවාහන තදබදය පහසු කිරීම, කොළඹ සිට කටුනායක ගුවන්තොටුපල දක්වා ගමන් කාලය අඩුකිරීම සහ වරායේ සිට කොළඹ වෙනත් ප්‍රදේශයන්ට භාණ්ඩ ප්‍රවාහනයේ රථවාහන තදබදයට සහන සැලසීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ණය ගිවිසුම අනුව ව්‍යාපෘතියේ ඇස්තමේන්තු ගත මුළු පිරිවැය රුපියල් මිලියන 56,850 කට සමාන එක්සත් ජනපද ඩොලර් මිලියන 360.2 ක් වන අතර එම මුදලින් රුපියල් මිලියන 47,349 කට සමාන එක්සත් ජනපද ඩොලර් මිලියන 300 ක් සැපයීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි. ඉතිරි මුදල රුපියල් මිලියන 9,501 ක් ශ්‍රී ලංකා රජය විසින් අරමුදල් සපයනු ඇතැයි අපේක්ෂා කෙරේ. ව්‍යාපෘතියේ කටයුතු 2016 පෙබරවාරි මස ආරම්භ කරන ලද අතර 2025 වර්ෂයේදී නිම කිරීමට අපේක්ෂිතය.

## 1.3 මතය

---

මාගේ වාර්තාවේ 2.1 ඡේදයේ විස්තර කරන ලද කරුණුවල බලපෑම හැර මේ සමඟ ඇති මූල්‍ය ප්‍රකාශන මගින් 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහය සාමාන්‍යයෙන් පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

---

මම මාගේ විගණනය ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්වලට (ශ්‍රී.ල.වි.ප්‍ර) අනුව සිදු කරන ලදි.මෙම විගණන ප්‍රමිත යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශණ විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තිරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී වැඩසටහන අඛණ්ඩව පවත්වාගෙනයාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය වැඩසටහන ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විට මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා වැඩසටහනේ අඛණ්ඩ පැවැත්මට අදාල කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි. එම පාලනය හා සම්බන්ධ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.
ව්‍යාපෘතිය විසින් වාර්ෂිකව සහ කාලපරිච්ඡේදවලට අදාලව මූල්‍ය වාර්තා පිළියෙල කිරීමට හැකි වන අයුරින් තම සියලුම ආදායම්,වියදම්,වත්කම් සහ වගකීම් සම්බන්ධ පොත්පත් සහ වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.
මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරන ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස්

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| නව කැලණි පාලමේ සිට අතුරුගිරිය දක්වා කණු මතින් ඉදිවෙන අධිවේගී මාර්ගයේ කාර්ය මණ්ඩලය සඳහා සමාලෝචිත වර්ෂයේ ගෙවන ලද රු.මිලියන 8.19 ක වැටුප් හා දීමනා මෙම ව්‍යාපෘතිය යටතේ දක්වා තිබුණි. | ව්‍යාපෘතියේ කාර්යමණ්ඩල පිරිවැය ඉහළ යාම. | නව කැලණි පාලමේ සිට අතුරුගිරිය දක්වා කොන්ක්‍රීට් කණු මතින් දිවෙන අධිවේගී මාර්ගයේ කාර්ය මණ්ඩලය සඳහා වූ වැටුප් හා දීමනා ගෙවීම කණුමතින් දිවෙන වරාය පිවිසුම් අධිවේගී මාර්ග ව්‍යාපෘතියෙන් වෙන්ව වෙනම බැංකු ගිණුමක් ආරම්භ කරන තුරු පවත්වාගෙන යනු ලැබීය. | ව්‍යාපෘතිවල පිරිවැය වෙන වෙනම පිළිඹිබු කිරීම සඳහා ව්‍යාපෘතියේ පොදු කාර්යය පිරිවැය ව්‍යාපෘති අතර වෙන්කළ යුතුය. |

## 03. භෞතික කාර්යසාධනය

### 3.1 ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය

කොන්ක්‍රීට් කණුමත දිවෙන වරාය පිවිසුම් අධිවේගී මාර්ගයේ ඉදිකිරීම් කටයුතු අධීක්ෂණ උපදේශන සේවා, ගොඩනැගිලි සැලසුම් කිරීම් සහ ගොඩනැගිලි ඉදිකිරීම් අධීක්ෂණය සහ වරායේ වැඩ මුළු මෙම ව්‍යාපෘතිය මගින් සිදු කිරීමට අපේක්ෂා කරන ලදී .පහත නිරීක්ෂණයන් සිදුකරන ලදී.

### 3.2 උපයෝජනය නොකළ සම්පත්

| විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ව්‍යාපෘතියේ 2018 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මට අනුව කණු මතින් ඉදිවන වරාය පිවිසුම් | අධිවේගී මාර්ගය ඉදිකිරීම ආරම්භයේදී විය හැකි ප්‍රමාදයන්. | සිදුරු විමර්ෂණය වැඩි වීම හා උපදේශකවරයාගේ | සමස්ථ සැලැස්ම සැලකිල්ලට ගනිමින් ලබා කර ගත හැකි |

| | | | |
|---|---|---|---|
| අධිවේගී මාර්ගයේ ඉදිකිරීම් වැඩ කටයුතු සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ ආරම්භ කිරීමට සැලසුම් කර තිබූ අතර ඇස්තමේන්තු ගත වියදම රු.මිලියන 44,945 කි. කෙසේවෙතත් වරායේ ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය කිරීම සඳහා හැර 2019 ජුනි 30 දින වන විටත් එහි කටයුතු ආරම්භ කර නොතිබුණි.මෙහි ප්‍රතිඵලයක් ලෙස ව්‍යාපෘතියේ ප්‍රග්ධන වියදම් පියවා ගැනීම සඳහා 2018 අයවැය ඇස්තමේන්තුව මගින් වෙන්කර ඇති රු.මිලියන 3,040 අතුරින් රු.මිලියන 2,925 ක මුදලක් අනෙක් ව්‍යාපෘතියට මාරුකර තිබුණි. තවදුරටත් සමාලෝචනයට භාජනය වූ වර්ෂය අවසානයේදී රු.මිලියන 84.55 ක මුදලක් මහා භාණ්ඩාගාරය වෙත ආපසු ලබාදී තිබුණි. | | සවිස්තරාත්මක සැලසුම් ප්‍රමාද වීම හේතුවෙන් වැඩසටහන් ගත කර ඇති පරිදි අවම ලංසුවට ආරාධනා කිරීමට නොහැකි විය. | ඉලක්ක සැකසීමට තීරණය කළ යුතු අතර ඒ අනුව ප්‍රතිපාදන ඉල්ලා සිටිය යුතුය. |

**3.3 මානව සම්පත් උපයෝජනය**

| **විගණන නිරීක්ෂණය** | **බලපෑම** | **කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත කරන ලද ජ්‍යෙෂ්ඨ තනතුරු 21 න් ප්‍රධාන ඉංජිනේරුවරුන් දෙදෙනෙක්, නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ, ව්‍යාපෘති ඉංජිනේරු හා ව්‍යාපෘති ගණකාධිකාරී ඇතුළු තනතුරු 15 කට අදාල සුදුසුකම් සහිත නිලධාරීන් 2018 දෙසැම්බර් 31 දින වන විටත් බඳවාගෙන නොතිබුණි. තවද කළමනාකරණ සේවා | අධිවේගී මාර්ගය සැලසුම් කිරීම හා ඉදිකිරීම ආරම්භ කිරීමේදී සිදුවිය හැකි ප්‍රමාදයන්. | එකගවේ. | මාර්ග ඉදිකිරීම් කටයුතු ආරම්භ කළ ව්‍යාපෘතිය සඳහා සුදුසුකම් ලත් කාර්යමණ්ඩලයක් බඳවා ගැනීමට කඩිනමින් පියවර ගත යුතුය. |

දෙපාර්තමේතුවේ අනුමැතියෙන් තොරව දත්ත පදනම් ජාල පරිශීලකයෙකු බඳවාගෙන ඇති අතර සමාලෝචිත වර්ෂය තුළ රු.889,992 ක් වේතන ගෙවා තිබුණි.